**පෑලියගොඩ නගර සභාව**

**---------------------------**

**ගම්පහ දිස්ත්‍රික්කය**

**-------------------**

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 18 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පෑලියගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------------ | -------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් රු.336,149 ක පුස්තකාල පොත් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | අත්පත් කර ගත් ප්‍රාග්ධන වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. | අතපසුවීමකින් මගහැරී ඇති අතර 2020 අවසන් ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | පෙරටු කාර්යාලය ඉදිකිරීම සඳහා වැය කළ රු.377,339 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිකිරීම් වැය ප්‍රාග්ධනිත කළ යුතුවේ. | අතපසුවීමකින් මගහැරී ඇති අතර 2020 අවසන් ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අපහරණය කර තිබූ පිරිවැය රු.1,013,971 ක්වූ වාහන 05 ක් හා ටේලර් 05 ක් මෝටර් රථ හා කරත්ත ගිණුමෙන් ඉවත් කර නොතිබුණි. | අපහරණය කරනු ලබන ප්‍රාග්ධන භාණ්ඩ ගිණුම්වලින් ඉවත් කිරීම කළ යුතුවේ. | අතපසුවීමකින් මගහැරී ඇති අතර 2020 අවසන් ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඈ) | භෞතික තොග ශේෂය ගිණුම්වලට ගැලපීම් නොකර, රු. 5,687,871 ක තොග ලෙජර ශේෂය ගිණුම්ගත කර තිබුණි. | භෞතික තොග ශේෂය ගිණුම්වල පවත්වා ගත යුතුවේ. | පවතින වෙනස්කම් නිවැරදිකර භෞතික තොගය ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. |

1.3.2 නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ( අ) | 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 04 ක ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 13,959,625 ක වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | නව ගිණුම් ක්‍රමයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | වැය විෂයයන් 04 ක ගිණුමේ දක්වා තිබූ ශේෂයන්වල එකතුව හා උපලේඛනය අතර රු.3,169,425 ක වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | වැය වීම් පිළිබඳව නිවැරදිව වැය ලේඛනයේ දක්වා තිබුණද වැය ශීර්ෂයෙහි ඉතිරි වීම , එනම් වැය ශේෂයන් සඳහා වැරදි අගයන් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලැබිය යුතු ගිණුම් | | |
| | දිගින් දිගටම පැවත එන රු.3,966,656 ක් වූ ලැබිය යුතු ප්‍රාග්ධන ආදායම් හඳුනා ගෙන නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වර්ෂ 10 ක් පෙර සිට ලැබිය යුතු හා තොරතුරු නොමැතිකම හේතුවෙන් ගිණුම්වල දක්වා ඇති අතර 2020 වර්ෂයේදි මෙම ශේෂය සමුච්චිත අරමුදලට ගලපා ගිණුම් තාත්වික කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | ගෙවිය යුතු ගිණුම් | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට රු.23,121,058 ක් වූ වියදම් ණය හිමි ශේෂය තුළ 2014 වර්ෂයේ සිට පැවත එන රු.9,013,500 ක ශේෂයක් හා 2017 වර්ෂයේ සිට පැවත එන රු.1,228,379 ක් වූ අතර එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2014 හා 2017 වර්ෂවල ණයහිමි අධි වෙන් කිරීම් හේතුවෙන් මෙම ණය හිමි ශේෂය හටගෙන ඇති අතර ඉදිරි වර්ෂයේදි මෙම ශේෂය නිවැරදි කරමි. |

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට **උපලේඛන හා** කොටස් සහතිකය ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.5,170,666 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂ තහවුරු කරන තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ | අතීතයේ සිට පැවතීගෙන එන ලෙජර් ගිණුම් ශේෂයක් වන අතර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන අතර ලංකා විදුලි පුද්ගලික සමාගම විසින් මෙම කොටස් සභාව වෙත පිරිනමා ඇති අතර කොටස් සහතිකයේ පිටපතක් ලබාගෙන ඉදිරිපත් කරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 807,413 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 22,875,793 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. |
| (i) | වරිපනම් හා බදු | 56,000 | 45,457 | 38,172 | 25,645 | 42,000 | 43,046 | 36,467 | 26,918 |
| (ii) | කුලී | 932 | 1,862 | 62 | 3,963 | 110 | 1,265 | 278 | 997 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,800 | 1,956 | 1,919 | - | 1,400 | 1,427 | 1,421 | 6 |
| (iv) | වෙනත් ආදායම් | 115 | 507 | - | - | 30 | 353 | 10 | 343 |
| | | 58,847 | 49,782 | 40,153 | 29,608 | 43,540 | 46,091 | 38,176 | 28,264 |

2.2.2 කුලී
-----

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ---------- | -------------------------- |
| ( අ) | නගර සහා පොදු වෙළඳපලෙහි ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබන කඩ කාමර 06 ක් සම්බන්ධයෙන් ගිවිසුම්ගතවීමක් සිදු කර නොතිබූ අතර එක් කඩ කාමරයක ගිවිසුම් කාලය නිශ්චිතව දක්වා නොතිබුණි. | කඩ බදුදීමේදී සියළු කොන්දේසි ඇතුළත්ව ගිවිසුම්ගත විය යුතුවේ. | නගර සහා පොදු වෙළඳ පොලෙහි ව්‍යාපාර පවත්වාගෙන යන කඩ කාමර අතරින් කඩ කාමර 04 ක බදුකරුවන්ගේ නම් ලේඛනවල පමණක් සටහන්ව ඇති අතර ඒ සම්බන්ධව නීත්‍යානුකූලභාවය තහවුරු කරගැනීම කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | නගර සහා පොදු වෙළඳපලෙහි ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබන කඩ කාමර 10 ක ගිවිසුම් කාලය 1986 දෙසැම්බර් 31 දිනෙන් අවසන්ව තිබුණද ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව බදු කාල සීමා ඉකුත් වීම සම්බන්ධයෙන් නව ගිවිසුම්ගත වීම සිදුකළ යුතුවේ. | පළාත් පාලන ආයතනය මගින් නිකුත් කර ඇති ගිවිසුමට අදාළව බදුකරුවන් එම ගිවිසුමට ඇතුළත්කර ගැනීමට නීතිමය කටයුතු කරමින් පවතින බව දන්වමි. |
| (ඇ) | පොදු වෙළඳපලෙහි ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබන කඩ කාමර 28 ක් සඳහා 2018 මැයි මස 01 දින සිට පනවා තිබූ නව තක්සේරුවෙන් 2019 දෙසැම්බර් 31 දින සිට සියයට 50 ක් අය කර ගෙන නොතිබුණි. | හිඟමුදල් අය කර ගත යුතුවේ. | මෙම කඩ කාමර 28 හි සියයට 50 ක් අයකරගනු ලැබුවේ එහි පොදු පහසුකම් සකස් කර දෙන තෙක් පමණි. හිඟ සියයට 50 වටිනාකම අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |

3. **මෙහෙයුම් සමාලෝචනය**
-----------------------------

3.1 මානව සම්පත් කළමනාකරණය
---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ---------- | -------------------------- |
| අනුමත කාර්ය මණ්ඩලයේ වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරු 18 න් 16 ක් සම්පූර්ණ කර තිබුණද 2019 වර්ෂය තුළ ක්ෂේත්‍ර කම්කරුවන් යොදාගෙන කිසිදු නඩත්තු කටයුත්තක් ඉටුකර නොතිබුණි.මෙම කම්කරුවන් 16 දෙනා අතරින් 09 දෙනෙකු වෙනත් | වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් සඳහා අදාල බලධාරින් විසින් දෛනික රාජකාරි පැවරීමක් සිදුකර එම කාර්යයන්හි යෙදවිය යුතුවේ. | නඩත්තු ඒකකයක් සකස් කිරීමට නියමිතව ඇති අතර ඒ වනතුරු මාර්ග කම්කරුවන්, විධිමත්ව සකසන ලද සැලැස්මක් අනුව 2020 ජූලි 01 දින සිට යෙදවීමට නියමිත බව දන්වමි. |

කාර්යයන්වල සේවයේ යොදවා තිබූ අතර ඉතිරි 07 දෙනා කිසිදු කාර්යයක යොදවා නොතිබුණි.

3.2 මතභේදයට තුඩු දෙන කරුණු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පැලියගොඩ මීගමුව පාරේ අංක 171 දරන ස්ථානය නීති විරෝධී ලෙස කඩා බිඳ දමා බඩු සොරකම් කර ඇති බව පවසා සභාවට හා සභාපතිට එරෙහිව පෞද්ගලික පාර්ශවයක් විසින් රුපියල් ලක්ෂ 20 ක වන්දියක් ඉල්ලා 2010 මාර්තු 03 දින නඩුවක් ගොනු කර තිබූ අතර ඒ සඳහා නිතීඥ ගාස්තු ලෙස රු.112,000 ක් ගෙවීම් කර තිබුණි. නීතිඥවරයන් තිදෙනකු ගාස්තු නොගෙවීම මත නඩුවෙන් ඉවත්ව තිබූ අතර අවසානවරට ඉදිරිපත්ව තිබූ නීතිඥවරයාද නඩුවෙන් ඉවත්වන බව දන්වා තිබුණි. එහෙත් මෙම නඩුව සම්බන්ධ විසඳුමක් ලැබූ ආකාරයක් අනාවරණය නොවීය. | පැන නැගී ඇති නඩු, විසඳුම් ලබා ගැනීමට කටයුතු කිරිම හා නීතිඥ ගාස්තු ඵලදායීව වැය කිරීම කළ යුතුවේ. | නඩුව සම්බන්ධයෙන් 2018 වර්ෂයට පසු කිසිදු කැඳවීමක් හෝ සිතාසියක් ලැබී නොමැති. නිසා නව නීතිඥවරයකු පත් කර ගැනීමටද සභාව කටයුතු නොකරන ලද බව දන්වමි. |

3.3 වත්කම් කළමනාකරණය

3.3.1 අභාවිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශයෙන් 2015 ජුලි 02 දින සභාවට ලැබුණු රු.17,649,179 ක් වටිනා බැකෝ යන්ත්‍රය එදින සිට ප්‍රයෝජනයට නොගෙන නගර සභා භූමියේ ගාල්කර තිබුණි.එහෙත් එදින සිට 2019 දෙසැම්බර් 31 දක්වා රක්ෂණය කිරිම, සේවා කිරීම හා අලුත්වැඩියා කටයුතු සඳහා රු.340,861 ක වියදමක් දරා තිබුණි. | කාර්යක්ෂමව උපයෝජනය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වෙනත් ආයතනයකට ලබා දීමට සහා අනුමැතිය නොලැබුන බැවින් භාවිතයට නොගෙන තැබීමට සිදුවූ බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කසළ කළමනාකරණය සඳහා යොදාගන්නා ලද ට්‍රැක්ටර 03 ක් 2020 ජනවාරි 27 වන විට අක්‍රීය තත්ත්වයේ පැවතිණි. | අක්‍රීය වාහන අලුත්වැඩියා කර ධාවනයට යොදා ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ වනවිට අලුත්වැඩියා කිරීමට කටයුතු යොදා ඇති බව දන්වමි. |

3.4 ප්‍රසම්පාදනය
---------------

3.4.1 කොන්ත්‍රාත් පාලනය
----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 හා 2019 දෙවර්ෂවල බකිනිගහ පිල්ලෑව ප්‍රදේශයේ මාර්ග 08 ක මුළු දික් අඩි 1553.29 ක් කොන්ක්‍රීට් කිරිම සඳහා වැයකල මුදල රු.2,858,399 ක්වූ අතර යෙදූ රෙඩිමික්ස් ප්‍රමාණය 133.76 $m^3$ ක් විය. ඇස්තමේන්තුව අනුව කොන්ක්‍රීට් තට්ටුවේ ඝණකම අඟල් 04 ක් විය යුතු නමුත් හරස් කැපුම් ස්ථාන 05 කින් ලබාගත් මිනුම් අනුව ඝණකම අඟල් 2.75 ත් 3.5 ත් අතර පරාසයක පැවතිණි.ඒ අනුව ඝන මීටර් 27.86 ක කොන්ක්‍රීට් සඳහා වැඩියෙන් කරන ලද ගෙවීම රු.445,202 ක් විය. | මාර්ග ඉදිකිරීමේදී කොන්ක්‍රීට් තට්ටුවේ ඝණකම පිළිබඳ පරීක්ෂාකාරී විය යුතු අතර එක් එක් ඉදිකිරීම් වෙනුවෙන් වෙන් වෙන්ව ලිපිගොනු පවත්වා ගත යුතුවේ. | 2019 ට පෙර වර්ෂයන්වලදී සිදුකරන ලද මාර්ග ව්‍යාපෘති වල ලිපිගොනුවලට අදාලව මාර්ගයේ නිශ්චිත ස්ථානය හඳුනාගැනීමේ අපහසුතාවයක් පවතින අතර කොන්ක්‍රීට් තට්ටුවේ ඝනකම 4" ප්‍රමාණයට සිදු කලද විවිධ අපහසුතා නිසා කොන්ක්‍රීට් ඇතිරීම අපේක්ෂිත මට්ටමින් සිදු නොවීමට ඉඩ ඇත. නමුත් ඇස්තමේන්තුවේ කොන්ක්‍රීට් ධාරිතාව මුළුමනින්ම අදාල ක්ෂේත්‍රයේ අතුරා ඇති බව දන්වමි. |